පාපන්දු ක්‍රීඩාව

පාපන්දු ලෝක ඉතිහාසය

1. මෙය ක්‍රි:පූ: 30 වන ශතවර්ෂයේ පෙර දිග රටවලින් ආරම්භ වී ඇති අතර, ජපානයේ පාපන්දුවට සමාන හුලං පුරවන ලද බෝලයට අතින් හා පාදයෙන් ගසා ක්‍රීඩා කල අතර, එය භයානක ස්වරූපයක් ගෙන ඇත, චීනයේද ජපානයට සමානව කණු දෙකක දැලක් බැඳ ඒ මැදින් සිදුරක් සාදා අතින් හා පයින් පහරදී රැගෙන ගොස් එම සිදුරෙන් දැමූ විට ලකුණු ලබා ගැනීමේ ක්‍රමය භාවිතා කර ඇත.

2. ඒ සමගම අප්‍රිකාවේ කොවුරා නමින් ඒ සමාන ක්‍රීඩාවක් පවත්වා ඇත, බටහිර රටවල ගත් කල මුලින්ම ග්‍රීසියේ ස්පුවරන් මයිස් යනුවෙන් පාපන්දු ක්‍රීඩාවට සමාන ක්‍රීඩාවක් තිබූ අතර, එය ඔලිම්පික් තරඟ සඳහාද ඇතුලත් කර ඇත. එවකට ග්‍රීසිය ඇතුලුව අනෙක් රටවල හමුදාවන්ගේ ශාරීරික යෝග්‍යතාවය සඳහා පැවැත්වූ ක්‍රීඩාවකි.

3. රෝමයේ හස්පතුන් නමින් ක්‍රීඩාවක් පවත්වා ඇති අතර, එරට සොල්දාදුවාගේ ශාරීරික යෝග්‍යතාවය සඳහා පවත්වා ඇත. මෙහිදී සීමා නොමැති පිටියක වැලි පුරවන ලද බෝලයක් අතින් තල්ලු කර ගෙන යන කණ්ඩායම් දෙකකින් සිදුකර ඇත. වැඩිපුර තල්ලු කල කණ්ඩායම ජයගෙන ඇත.

4. ප්‍රංශයේ මෙම ක්‍රීඩාවට සමාන ක්‍රීඩාවක් චෞල් සොෆ්ල් නමින් පවත්වාගෙන ඇත. ඉතාලියේ කැල්සියෝ නමින් මෙම ක්‍රීඩාවට සමාන ක්‍රීඩාවක් පවත්වාගෙන ඇත. මෙහිදී දිග මී:137 ක් ද පලල මී: 50 ක් ද වන ක්‍රීඩා පිටියක් සාදා එක් පිලකට ක්‍රීඩකයින් 27 දෙනෙකු ලෙස මෙය පවත්වාගෙන ගොස් ඇති අතර, තවද මෙම ක්‍රීඩාවට විනිසුරුවන් 06 දෙනෙකු සහභාගි කරගෙන ඇත.

5. 1823 දී විශ්ව විද්‍යාලයක විලියම් වෙස් යන ශිෂ්‍යා අතින් හා පාදයෙන් පන්දුවට ගහන අතරතුර තරඟය නරඹමින් සිටි ප්‍රභූ පිරිසක් හට ඇතිවූ එක්තරා අදහසක් අනුව අතින් හා පයින් පහරදීම රග්බි ලෙසත්, පාදයෙන් පහරදීම පාපන්දු ලෙසත් සම්මුතියකට එළඹ ඇත. ඉන් පසු 1860 දී මෙම පාදයෙන් පමණක් පහරදෙන ක්‍රීඩාව පාපන්දු ලෙසත් අතින් හා පදයෙන් පහරදෙන ක්‍රීඩාව රග්බි ලෙසත් නීතිගත කර ඇත.

6. පාපන්දු ක්‍රීඩාව සඳහා නීති මාලාවක් සකස් කිරීම සඳහා ප්‍රථම වරට 1863 සම්මේලනයක් පවත්වා ඇති අතර, ඍහඩබෂීය ඡඩධඹ ඊබබ ීධඍෂ්ඹෂධහ පිහිටුවා ඇති අතර එහිදි පලමුවෙන්ම එක් කණ්ඩායමක් සඳහා ක්‍රීඩකයින් 11 කට පමණක් ක්‍රීඩා කල යුතු බව සම්මුතියකට එළඹ ඇත:

අ. 1863 දි ඔප් සයිඩ් නීතිය ගෙන එන ලදි.

ආ. 1888 දි එංගලන්තයේ වෘතිමය පාපන්දු ක්‍රීඩාව ආරම්භ විය.

ඇ. 1891 දි දඩුවම් පහර නීති ගත කර ඇත.

ඈ. 1892 දි ජාත්‍යන්තර පාපන්දු මණ්ඩලය ආරම්භ විය.

ඉ. 1896 දි ඔප් සයිඩ් නීතිය නීති ගත කර ඇත.

ඊ. 1904 දි ඵෂ්ත් පිහිටුවා ගන්නා ලද අතර ප්‍රථම ජාත්‍යන්තර තරඟය බෙල්පියමය හා ප්‍රංශය අතර පැවැත් විය:

(1)	F	ෆෙඩරේෂන්	FEDARATION
(2)	I	ඉන්ටර්නැෂනල්	INTERNATIONAL
(3)	F	ෆුට් බෝල්	FOOT BALL
(4)	A	ඇසෝසියේෂන්	ASSOCIATION

ශ්‍රී ලංකා පාපන්දු ඉතිහාසය

7. අරම්භක වසර වනුයේ 1911 අප්‍රේල් 04 වනදාය, කොළඹ ක්‍රිස්ටල් හෝටලයේ පැවති රැස්වීමකදී මෙහිදී ප්‍රථම වරට කොළඹ ලිග් පාපන්දු සංගමය පිහිටුවන ලදි, 1914 සහ 1917 දක්වා කාලය තුල පැවති ලෝක යුද්ධය නිසා පාපන්දු ක්‍රීඩාව ඇණහිට ඇත. 1918 දි වෙළඳ සේවා පාපන්දු සංගමයද 1920 දි රාජ්‍ය සේවා පාපන්දු සංගමයද ආරම්භ විය. ඒ කාලය තුල ක්‍රීඩකයින් පාවහන් නොමැතිව ක්‍රීඩා කර ඇත. මෙම වකවානුවේ ශ්‍රී ලංකා ප්‍රථම සංචාරය සිංගප්පූරුවට ගොස් ඇත. 1920 පාපන්දු විනිසුරුවන්ගේ සංගමය පිහිටුවන ලදි. 1933 දි ප්‍රථම වරට ඉන්දියානු කණ්ඩායම ලංකාවට පැමිණ ක්‍රීඩා කර ඇත. 1940 අන්තර් දිස්ත්‍රික් තරඟ ආරම්භ විය. 1981 ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය සංශෝධනය කර පාපන්දු පාලන මණ්ඩලය නමින් පිහිටුවන ලදි. 1959 දි එවකට ක්‍රීඩා ඇමතිව සිටි වයිඒ සුගතදාස මහතා පාපන්දු ක්‍රීඩාව වෙනුවෙන් වෙන්වූ සුගතදාස ක්‍රීඩාංගනය ලබාදීම පාපන්දු ක්‍රීඩාවට කල විශාල සේවාවකි.

8. පාපන්දු ක්‍රීඩා පිටියේ නිති රීති පහතින් දක්වා ඇතඃ

අ. ක්‍රීඩා පිටිය.

ආ. බෝලය.

ඇ. ක්‍රීඩක සංඛ්‍යාව.

ඈ. ක්‍රීඩා උපකරණ.

ඉ. විනිසුරු.

ඊ. සහය විනිසුරු.

උ. තරඟ කාල සීමාව.

ඌ. තරඟය ආරම්භ කිරීම හා නැවත ආරම්භ කිරීම.

එ. පන්දුව ක්‍රීඩාවේ යෙදෙන නොයෙදෙන අවස්ථා.

ඒ. ලකුණු ලබා ගැනීමේ ක්‍රම.

ඔ. නිසි නොවන ස්ථානගත වීම.

ඕ. නීති විරෝධී විෂමාචාර ක්‍රියා.

ක. නිදහස් පහර.

ග. පන්දුව ක්‍රීඩා පිටිය දෙසට විසි කිරීම.

ච. ගෝල් පහර.

ජ. මුලු පහර (කෝණ පහර).

න. දඬුවම් පහර.

නීතිය අංක 1 ක්‍රීඩා පිටිය මතුපිට පිටිය

9. තරඟාවලියේ නියමයන්ට අනුකූලව ස්වාභාවික හෝ කෘතිම මතුපිට පිටිවල තකරඟ පැවැත්වීමට හැකි වේ.

මිනුම්

10. ක්‍රීඩා පිටිය සෘජුකෝණාශ්‍ර විය යුතුය, ස්පර්ශ රේඛාවේ දිග ගෝල රේඛාවේ දිගට වඩා වැඩි විය යුතුය:

අ. දිග අවම මීටර 90 (යාර 100).

ආ. උපරිම මීටර 120 (යාර 130).

ඇ. පළල අවම මීටර 45 (යාර 50).

ඈ. උපරිම මීටර 90 (යාර 100).

11. ජාත්‍යන්තර තරඟ පහත සීමාවන්ට යටත්ව සිදු කරනු ලබයි:

අ. දිග අවම මීටර 100 (යාර 110).

ආ. උපරිම මීටර 110 (යාර 120).

ඇ. පළල අවම මීටර 64 (යාර 70).

ඈ. උපරිම මීටර 75 (යාර 80).

12. පිටිය සළකුණු කිරිම පහත සඳහන් පරිදි සිදු කරනු ලබයි:

අ. රේඛා වලින් පිටය සළකුණු කෙරේ, මෙම රේඛා ක්‍රීඩා පිටියේ ඉඩ ප්‍රමාණය පෙන්නුම් කරන සීමා රේඛාවන් වේ.

ආ. දිගු සීමා රේඛා ස්පර්ශ රේඛා ලෙසද, කෙටි සීමා රේඛා ගෝල් රේඛා ලෙසද හැඳින්වේ.

ඇ. සෑම රේඛාවක්ම 12 සෙ.ම (අඟල් 5) ට වඩා පළලින් වැඩි නොවිය යුතුය.

ඈ. ක්‍රීඩා පිටිය මධ්‍ය රේඛාවක් මගින් සමාන කොටස් දෙකකට වෙන්. මධ්‍ය සළකුණු මධ්‍ය රේඛාවේ මධ්‍ය ලක්ෂ්‍ය මත පෙන්නුම්. අර්ධ විශ්කම්භය මීටර් 9.15 (යාර 10) ක් වූ වෘත්තයක් එය වටා සළකුණු කෙරේ.

ගෝල් ප්‍රදේශය

13. ගෝල් රේඛාවට සෘජුකෝණිකව එක් එක් ගෝල් කණුවල ඇතුල් පැත්තේ සිට මීටර් 5,5 (යාර 06) ක් වන සේ රේඛා දෙකක් සටහන් කෙරේ. මෙම රේඛා දෙක ක්‍රීඩා පිටිය තුලට මීටර් 5,5 (යාර 06) ක් දුරට විහිදෙන අතර ඒවා ගෝල් රේඛාවට සමාන්තර වූ රේඛාවකින් සම්බන්ධ කර ඇත. මෙම රේඛාවලින් සහ ගෝල් රේඛාවෙන් වටවූ ප්‍රදේශය ගෝල් ප්‍රදේශය වේ. (රූප සටහන 1 බලන්න)



රූප සටහන 1

<u>දඬුවම් ප්‍රදේශය</u>

11. ගෝල් රේඛාවට සෘජුකෝණීව එක් එක් ගෝල් කණුවල ඇතුල් පැත්තේ සිට 16,5 ඒ (යාර 18) වන සේ දෙපසින් රේඛා දෙකක් සටහන් කරනු ඇත. මෙම රේඛා දෙක ක්‍රීඩා පිටිය තුලට 16.5 ඒ දුරට විහිදෙන අතර ඒවා ගෝල රේඛාවට සමාන්තරවූ රේඛාවකින් යා තරනු ලබයි. (රූප සටහන 2 බලන්න)



රූප සටහන 2

<u>කොඩි කණු</u>

12. උස මීටර් 1,5 (අඩි 5) කට අඩු නොවන්නාවූද මුදුණ උල් නොවන්නාවූද කොඩි කණුව බැගින් සෑම කෙළවරකම සිටවනු ලැබේ. තවද මධ්‍ය රේඛාවේ දෙකෙළවරෙහි ස්පර්ශ රේඛාවේ සිට 1 ඒ දුරින් සිටුවීමට හැකිය.

<u>කෝණ චාපය</u>

13. එක් එක් කොඩි කණු කෙළවරවල් වල සිට 1ඒ අර්ධ විශ්කම්භයකින් යුක්ත වූ වෘත්ත කාලක් ක්‍රීඩා පිටිය තුල අඳිනු ලැබේ.

<u>ගෝල</u>

14. එක් එක් ගෝල රේඛාවේ මැද ගෝලයක් තැබිය යුතු වේ, එය කොන් පොඩි කණුවල සිට සම දුරින් පිහිටන සිරස් කණු දෙකකින් ද ඒවා ඉහළින් යා කරන සමාන්තර තිරස් දණ්ඩකින් සමන්විත වේ.

<u>නීතිය අංක 02 පන්දුව ගුණාත්මකභාවය හා මිණුම්</u>

15. පන්දුව ලක්‍ෂණ පහත සඳහන් පරිදි වේ:

අ. ගෝලාකාර විය යුතුයි.

ආ. සම් හෝ වෙනත් සුදුසු ද්‍රව්‍යකින් නිමවා තිබිය යුතුය.

ඇ. වට ප්‍රමාණය 70 සප (අඟල් 28)ට නොවැඩි 68 සප (අඟල් 27)ට නොඅඩු විය යුතුය.

ඈ. තරඟය ආරම්භයේදි බර ග්‍රෑම් 450ට නොවැඩි 410 ට නොඅඩු විය යුතුය.

ඉ. පීඩනය මුහුදු මට්ටමේ සිට වායාගෝලීය පීඩනය 0,6 ජ සිට 1,1 ජ අතර විය යුතුය.

නීතිය අංක 03 ක්‍රීඩක සංඛ්‍යාව

ක්‍රීඩකයන්

16. තරඟයක් කණ්ඩායම් දෙකක් විසින් ක්‍රීඩා කරයි, එක් කණ්ඩායමක් ක්‍රීඩකයින් 11 දෙනෙකුට නොවැඩි ප්‍රමාණයකින් සමන්විත විය යුතුය, එයින් එක් අයෙකු අනිවාර්යෙන්ම දැල් රකින්නා විය යුතුය. කණ්ඩායමක් ක්‍රීඩකයින් හත් දෙනෙකුට වඩා අඩු ප්‍රමාණයකින් සමන්විත නම් තරඟයක් ආරම්භ නොකෙරේ.

නිල තරඟාවලියන්

17. ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයේ නිල තරඟාවලියක ආදේශ ක්‍රීඩකයන් තිදෙනෙකුගේ උපරිමයට යටත්ව භාවිතා කල හැකිය.

18. තරඟාවලියේ නීති මගින් ආදේශකයන් 3 සිට 7 දක්වා ප්‍රමාණයෙන් කොපමණ ප්‍රමාණයක් යෝජනා කල හැකිද යන්න සඳහන් කල යුතුය.

නීතිය අංක 04 ක්‍රීඩකයන්ගේ උපකරන හා ආරක්ෂාව

19. ක්‍රීඩකයෙකු තමාට හෝ වෙනත් ක්‍රීඩකයෙකුට අනතුරු දායක වන අන්දමේ කිසිම උපකරනයක් භාවිතා කිරිම හෝ පැලදිම නොකල යුතුයි. මූලික උපකරණ:

අ. ජර්සියක්.

ආ. කොටකලිසමක්.

ඇ. දන නාල ආවර්නය.

ඈ. දිගු මේස්.

ඉ. පාවහන්.

නීතිය අංක 05 විනිසුරු -විනිසුරුගේ නීතිමය බලතල

20. තමා පත්කරනු ලබන තරඟය සම්බන්ධයෙන් තරඟ නීති ක්‍රියාත්මක කිරීමේ පූර්ණ බලතල එක් එක් තරඟය පාලනය කරනු ලබන විනිසුරුට හිමි වේ.

21. විනිසුරුගේ නීතිමය බලතල හා රාජකාරි පහතින් දක්වා ඇත:

අ. තරඟ නීති ක්‍රීඩාවේ යොදවයි.

ආ. පන්දුව හා ක්‍රීඩා උපකරණ පිළිබඳව පරීක්ෂා කර බලයි.

ඇ. නීතිය කඩකිරීමක් සිදුවන ඕනෑම අවස්ථාවක ඔහුගේ අභිමතය පරිදි තරඟය නතර කිරීම, අත්හිටුම හෝ අවසන් කිරීම සිදුකරයි.

ඈ. බාහිරින් සිදුවන කුමන හෝ අන්දමේ බාධාකිරීමක් මත තරඟය නතර කිරීම, අත්හිටුවීම හෝ අවසන් කිරීම සිදු කරයි.

ඉ. ක්‍රීඩකයෙකු එකම අවස්ථාවේදි එකවරදකට වැඩියෙන් සිදුකරනු ලැබුවහොත් ඉතා බරපතල වරදකට දඬුවම් ලබාදේ.

ඊ. තමා නුදුටු සිද්ධීන් පිළිබඳව සහය විනිසුරුගේ උපදෙස් අනුව ක්‍රියාකරයි.

උ. අවසර නොලත් පුද්ගලයන්ට ක්‍රීඩාපිටියට ඇතුල් වීමට ඉඩ නොදීමට වගබලා ගත යුතුයි.

ඌ. තරඟය නතර කිරීමෙන් පසුව නැවත ආරම්භ කරයි.

නීතිය අංක 06 සහය විනිසුරු රාජකාරි

20. විනිසුරුගේ තීරණ අනුව කටයුතු කිරීම සඳහා සහය විනිසුරුවන් දෙදෙනෙකු පත්කරනු ලැබේ, ඔවුන් පෙන්නුම් කල යුතු වන්නේ:

අ. පන්දුව සම්පූර්ණයෙන් ක්‍රීඩාපිටියෙන් ඉවත ගිය විට.

ආ. කොන් පහර, ගෝල් පහර හෝ තුලට විසිකිරීම කුමන පැත්තකට අයත්වේද යන්න.

ඇ. නිසි නොවන ස්ථානයක සිටීමෙන් ක්‍රීඩකයෙකු දඩුවම් ලැබිය යුතු අවස්ථාව.

ඈ. ආදේශනයක් සඳහා ඉල්ලුම් කල විට.

ඉ. විනිසුරුගේ දෘෂ්ටියට හසු නොවී සිදුවූ වැරදි සහගත ක්‍රියාවන් හෝ වෙනත් ඕනෑම සිද්ධියක්.

ඊ. ද්‍ඩුවම් පහරවලදී පන්දුවට පහර එල්ලකිරීමට පෙර දැල් රකින්නා ඉදිරියට චලනය වූවාද පන්දුව රේඛාව පසුකලා ද යන්න.

නීතිය අංක 07 තරඟ කාලසීමාව ක්‍රීඩා කිරීමේ කාල පරිච්ජේදය

21. සහභාගිවන කණ්ඩායම් දෙක හා විනිසුරු අතර අන්තර් එකඟතාවයකට කලින් පත්වී නොමැති නම් තරඟයක් විනාඩි 45 ක සමාන කාල පරිච්ජේද දෙකකින් සමන්විත වේ.

22. අර්ධ කාල විවේකය ලබාදීම:

අ. අර්ධ කාලයේදී ක්‍රීඩකයන්ට විවේකයක් ලබාගැනීම සඳහා අයිතිවාසිකමක් ඇත, අර්ධ විවේක කාලය විනාඩි 15 ඉක්ම නොවිය යුතුය.

ආ. අර්ධ කාල විවේකයේ කාල සීමාව විනිසුරුගේ අනුමැතිය අනුව පමණක් සංශෝධනය කල හැකිය.

23. කාලය අපතේ යෑමේ අවස්ථා පහතින් දක්වා ඇත:

අ. අදේශනයන්හිදී

ආ. ක්‍රීඩකයන්ට සිදුවන අනතුරු විමර්ශනය කිරීම සඳහා.

ඇ. ප්‍රතිකාර සඳහා අනතුරට පත් ක්‍රීඩකයන් ක්‍රීඩාපිටියෙන් ඉවතට ගෙන යාම.

ඈ. කාලය අපතේ යෑම සම්බන්ධ ඉඩකඩ ලබාදීම විනිසුරුගේ අභිමතය මත සිදු වේ.

නීතිය අංක 08

24. තරඟය ආරම්භ කිරීම හා නැවත ආරම්භ කිරීම මූලික වශයෙන් සිදුකරනු ලබන ක්‍රියාමාර්ග:

අ. කාසියක් ඉහළ දැම්මෙන් කාසියේ වාසිය ලබන කණ්ඩායම තරඟයේ පළමු භාගය කුමන ගෝලයට පහර එල්ල කරන්නේදැයි තීරණය කරනු ලබයි.

ආ. අනෙක් කණ්ඩායම තරඟ ආරම්භය සඳහා පා ඇරඹුම සිදු කරනු ලබයි.

ඇ. කාසිය වාසිය ලබන කණ්ඩායම දෙවන භාගයේ තරඟ ආරම්භය සඳහා පා ඇරඹුම සිදුකරයි.

ඈ. තරඟයේ දෙවන භාගයේදි කණ්ඩායම් පැති මාරුකර ප්‍රතිවිරුද්ධ ගෝල්වලට පහර එල්ල කරයි.

<u>පා ඇරඹුම සිදුකරනු ලබන අවස්ථා</u>

25. පා ඇරඹුම යනු තරඟයක් ආරම්භ කිරීම හෝ නැවත ආරම්භ කිරීමේ ක්‍රමයයි. මෙය පහත පරිදි භාවිතා වේ:

අ. තරඟය ආරම්භයේදි.

ආ. ගෝල් ලකුණක් ලබාගත් පසු.

ඇ. දෙවන භාගය ආරම්භයේදි.

26. පා ඇරඹුම සිදුකරනු ලබන ක්‍රියා මාර්ගය:

අ. සියලුම ක්‍රීඩකයන් ක්‍රීඩාපිටියේ තමාට අයත් භාගයේ සිටී.

ආ. පන්දුව ක්‍රීඩා කරන තුරු පා ඇරඹුම ගන්නා කණ්ඩායමට ප්‍රතිවිරුද්ධ කණ්ඩායම පන්දුවේ සිට මීටර් 9,15 ක් ඈතින් සිටිය යුතුය.

ඇ. පන්දුව මධ්‍ය ලක්ෂ්‍ය මත නිශ්චලව තිබේ.

ඈ. විනිසුරු සංඥාවක් ලබාදේ.

ඉ. පන්දුවට පා පහරක් ගැසීමෙන් ඉදිරියට චලනය වූ විට පන්දුව ක්‍රියාකාරී වේ.

ඊ. වෙනත් ක්‍රීඩකයෙකු ස්පර්ශ කරන තුරු පා ඇරඹුම ලබාගත් ක්‍රීඩකයා දෙවන වර ස්පර්ශ නොකල යුතුය.

උ. කණ්ඩායමක් ගෝල් ලකුණු ලබාගත් පසු අනෙක් කණ්ඩායම පා ඇරඹුම ලබාගනු ඇත.

<u>නීතිය අංක 09 පන්දුව ක්‍රීඩාවේ යෙදෙන හා නොයෙදෙන අවස්ථා</u>

27. ගුවනින් හෝ බිම දිගේ එය ස්පර්ශ රේඛාව හෝ ගෝල් රේඛාව සම්පූර්ණයෙන් පසුකල විට විනිසුරු විසින් තරඟය නතර කලවිට.

<u>පන්දුව ක්‍රීඩාවේ නොයෙදෙන අවස්ථා</u>

28. පහත කරුණු ඇතුලත්ව අන් සෑම අවස්ථාවකදීම පන්දුව ක්‍රීඩාවේ යෙදේ:

අ. එය ගෝල කණු තිරස් දණ්ඩ හෝ කොන් කොඩි කණුවේ ගැටී පිටියට අවතීර්ණ වූ විට.

ආ. ක්‍රීඩාපිටිය තුල සිටිනා විනිසුරුගේ හෝ සහය විනිසුරුගේ ඇඟේ වැදී පැමිණි විට.

නීතිය අංක 10 ලකුණු ලබාගැනීමේ ක්‍රමය, ගෝලයක් ලබා ගැනීම

29. ගෝල ලකුණු ලබාගන්නා කණ්ඩායම විසින් තරඟ නීති කලින් උල්ලංඝණය කිරීමකින් තොරව සම්පූර්ණ පන්දුව ගෝල් කණු අතරින් හා තිරස් දණ්ඩ යටින් සම්පූර්ණ ගෝල රේඛාව පසුකර ගමන් කල විට.

නීතිය අංක 11 නිසි නොවන ස්ථානගතවීම

30. නිසි නොවන ස්ථානගතවීම:

අ. නිසි නොවන ස්ථානයක රැඳී සිටි පමණින්ම එය වරදක් ලෙස නොසලකනු ලැබේ.

ආ. ක්‍රීඩකයෙකු නිසි ස්ථානයක රැඳී සිටීමක් ලෙස සලකණු ලබයි.

ඇ. ඔහු පන්දුව හා දෙවන අවසන් ප්‍රතිවාදියා යන දෙකටම වඩා තම ප්‍රතිවාදින්ගේ ගෝල් රේඛාවට ආසන්නව සිටීමයි.

නීතිය අංක 12 නීති විරෝධි හා විෂමාචාර ක්‍රියා

31. නීති විරෝධි හා විෂමාචාර ක්‍රියා:

අ. ප්‍රතිවාදියෙකුට පාදයෙන් පහරදීම හෝ පහරදීමට තැත් කිරීම.

ආ. ප්‍රතිවාදියෙකු පාද පටලවා බිම දැමීම හෝ එයට තැත් කිරීම.

ඇ. ප්‍රතිවාදියෙකු වෙත පැනීම.

ඈ. ප්‍රතිවාදියෙකුට ආක්‍රමණකාරිව පහරදීම.

ඉ. ප්‍රතිවාදියෙකුට අතින් පහරදීම හෝ අතින් පහරදීමට තැත් කිරීම.

ඊ. ප්‍රතිවාදියෙකු තල්ලු කිරීම.

නීතිය අංක 13 නිදහස් පහර සෘජු හෝ අනියම් වේ

32. නිදහස් පහර සෘජු හෝ අනියම් වේ:

අ. සෘජු නිදහස් පා පහරක් කෙළින්ම ප්‍රතිවාදින්ගේ ගෝලය තුලට එල්ල කලහොත් ගෝල් ලකුණක් පිරිනමනු ලැබේ.

ආ. සෘජු නිදහස් පා පහරක් කෙළින්ම තම ගෝලය තුලට එල්ල කළහොත් ප්‍රතිවිරුද්ධ පිළට කොන් පහරක් පිරිනමනු ලැබේ.

ඇ. අනියම් නිදහස් පහර.

ඈ. ගෝල් ලකුණක් ලබාගත හැකි වනුයේ පන්දුව ගෝලය තුලට ඇතුලු වීමට පෙර වෙනත් ක්‍රීඩකයෙකුගේ ස්පර්ශ වීමෙන් පසුවය.

නීතිය අංක 14 දඬුවම් පහර

33. කණ්ඩායමකට එරෙහිව දඬුවම් පහරක් පිරිනමනු ලබන්නේ දඬුවම් ප්‍රදේශයේදී සිදුකරනු ලබන වැරදි සඳහාය. එය පහතින් කරුණු වශයෙන් දක්වා ඇත:

අ. පන්දුව සහ ක්‍රීඩකයන්ගේ පිහිටීම.

ආ. පන්දුව දඬුවම් සළකුණ මත තබනු ලැබේ.

ඇ. දඬුවම් පහර ගන්නා ක්‍රීඩකයා නිසියාකාරව හඳුනාගත යුතුය.

ඈ. ආරක්ෂක දැල් රකින්නා පන්දුවට පා පහර එල්ල කරන තුරු ගෝල් කණු අතර සිට ප්‍රහාරකයාට මුහුණලා ඔහුගේ ගෝල් රේඛාව මත සිටි.

ඉ. පා ප්‍රහාරකයා හැර අනෙක් ක්‍රීඩකයන් ස්ථානගත වනුයේ ක්‍රීඩාපිටිය ඇතුලත.

ඊ. දඬුවම් සීමාවෙන් පිටත.

උ. දඬුවම් සළකුණ පසුපසින්.

නීතිය අංක 15 තුලට විසි කිරීම

34. තුලට විසි කිරීම:

ආ. සම්පූර්ණයෙන් පන්දුව බිම දිගේ හෝ ගුවනින් ස්පර්ශ රේඛාව පසුකරමින් ගමන් කල විට.

ආ. ස්පර්ශ රේඛාව පසුකරමින් ගමන් කල ස්ථානයේ සිට.

ඇ. අවසන් වරට පන්දුව ස්පර්ශ කල ක්‍රීඩකයාගේ ප්‍රතිවාදින් වෙත.

35. ක්‍රියා මාර්ගය පන්දුව මුදාහරින මොහොතේදී:

අ. ක්‍රීඩාපිටියට මුහුණලා සිටියි.

ආ. ස්පර්ශ රේඛාවට පිටතින් පොළොව මත පාද දෙක ස්පර්ශ වී තිබිය යුතුය.

ඇ. දෑතම භාවිතා කරයි.

ඈ. හිස පසුපස සිට ඉහළින් පන්දුව මුදාහරියි.

නීතිය අංක 16 ගෝල් පහර එල්ල කිරීමේ ක්‍රියා පිළිවෙත

36. ගෝල් පහර එල්ල කිරීමේ ක්‍රියා පිළිවෙත:

අ. ගෝල් පහර යනු තරඟයක් නැවත ආරම්භ කිරීමේ ක්‍රමයයි.

ආ. ගෝල් පහරකින් ගෝල් ලකුණක් සෘජුවම ලබාගත හැකිය.

ඇ. ගෝල් පහරක් පිරිනමනු ලබන්නේ අවසන් වරට ප්‍රහාර කණ්ඩායමේ ක්‍රීඩකයෙකුගේ ස්පර්ශ වී සම්පූර්ණ පන්දුව බිම දිගේ හෝ ගුවනින් හෝ ගෝල් රේඛාව පසුකර ගමන්කල විටදීය.

<u>නීතිය අංක 17 කොන් පහර එල්ල කිරීමේ ක්‍රියා පිළිවෙත</u>

37. කොන් පහර එල්ල කිරීමේ ක්‍රියා පිළිවෙත පහත පරිදිවේ:

අ. කොන් පහරක් යනු තරඟයක් නැවත ආරම්භ කිරීමේ ක්‍රමයකි.

ආ. කොන් පහරකින් ගොල් ලකුණක් සෘජුවම ලබාගත හැකිය.

ඇ. කොන් පහරක් පිරිනමනු ලබන්නේ අවසන් වරට ආරක්ෂක කණ්ඩායමේ ක්‍රීඩකයෙකුගේ ස්පර්ශ වී සම්පූර්ණ පන්දුව බිම දිගේ හෝ ගුවනින් ගෝල් රේඛාව පසුකර අවස්ථාවේය.

38. කොන් පහර එල්ල කිරීමේ ක්‍රියාමාර්ගය පහතින් දක්වා ඇත:

අ. ආසන්නයේම ඇති කොඩි කණුවේ කොන් චාපය තුල පන්දුව තබනු ලැබේ.

ආ. කොන් කොඩි කණුව වෙනස් නොකල යුතුය.

ඇ. පන්දුව ක්‍රීඩාවේ යෙදෙන අවස්ථාවට පත්වන තුරු ප්‍රතිවාදීන් අවම වශයෙන් කොන් චාපයෙන් මීටර් 9,15 ක් දුරකින් සිටිය යුතුය.

ඈ. පා පහරින් පන්දුව චලනය වූ විට පන්දුව ක්‍රීඩාවේ යෙදෙන අවස්ථාවට පත්වේ.

ඉ. වෙනත් ක්‍රීඩකයෙකුගේ ස්පර්ශ වනතුරු පා ප්‍රහාරකයා දෙවන වරට පන්දුව ස්පර්ශ නොකල යුතුය.